**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා) උපාධි වැඩසටහන - පස්වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2015**

**අධ්‍යාපනයේ පදනම – ESU3226**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2015 අප්‍රේල් 02** **වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. අධ්‍යාපන දර්ශනය සහ අධ්‍යාපන න්‍යාය අතර ඇති සම්බන්ධතාව කෙටියෙන් පැහැදිලි කරන්න.

02. මාරියා මොන්ටිසෝරි අධ්‍යාපනයේ විශේෂ ලක්ෂණ තුනක් (03) ක් දක්වන්න.

03. සදාචාරය සහ විනය අතර සම්බන්ධතාව කෙටියෙන් විස්තර කරන්න.

04. අධ්‍යාපන පරමාර්ථ සහ අරමුණු සැකසීමේදී වැදගත් වන මූලාශ්‍ර පහක් (05) නම් කරන්න.

05. "ප්‍රතිමාන" සහ "අගයයන්" නිර්වචනය කරන්න.

06. සංස්කෘතිය සහ සමාජානුයෝජනය අතර පවත්නා සම්බන්ධතාව පැහැදිලි කරන්න.

07. නොවිධිමත් අධ්‍යාපනයේ ප්‍රබලතා තුනක් (03)විස්තර කරන්න.

08. "ආර්ථික වර්ධනය" සහ "සංවර්ධනය" යන සංකල්ප පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) දර්ශනය මඟින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන් තුනක් (03) ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) අධ්‍යාපන දර්ශනයේ විවිධ එළඹුම් දෙකක් (02) ක් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) අධ්‍යාපන ක්‍රියාවලියට සම්බන්ධවූවන්ට අධ්‍යාපන දර්ශනයේ ඇති වැදගත්කම නිදසුන් සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 09)

10. (i) ප්ලේටෝ හඳුන්වා දුන් අධ්‍යාපන දර්ශනයේ ප්‍රධාන අරමුණුන තුන (03) නම් කරන්න. (ලකුණු 03)

(ii) ප්ලේටෝ ඉදිරිපත් කළ විෂයමාලාව තුළින් සමබර පෞරුෂයක් සහිත පුද්ගලයෙක් බිහිකර ගත හැකි ආකාරය විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

(iii) ප්ලේටෝ ඉදිරිපත් කර ඇති අධ්‍යාපන චින්තාවන් වර්තමාන අධ්‍යාපන ක්‍රියාවලියට අදාළ කරගත හැකි ආකාරය නිදසුන් සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 09)

11. (i) 'සාරධර්ම' පිළිබඳ ඔබේම නිර්වචනයක් සපයන්න. (ලකුණු 05)

(ii) සාරධර්මවල කාර්යයන් තුනක් (03) විස්තර කරන්න. (ලකුණු 06)

(iii) සාරධර්ම සම්බන්ධයෙන් ගුරුවරුන් ගන්නා ප්‍රවේශ තුනක් (03) නිදසුන් සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 09)

12. (i) "සමාජානුයෝජනය" නිර්වචනය කරන්න. (ලකුණු 05)

(ii) සමාජානුයෝගී නොවූ ළමුන්ගේ හැසිරීම් රටා තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) දරුවන් සමාජානුයෝගී කිරීමේදී පවුලේ කාර්ය භාරය නිදසුන් සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 09)

13. (i) යාවජීව අධ්‍යාපනය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) යාවජීව අධ්‍යාපනය සහ ඉගෙනුම් සමාජය අතර ඇති සම්බන්ධතාව විවේචනාත්මකව විභාග කරන්න. (ලකුණු 08)

(iii) යාවජීව අධ්‍යාපනයේ වර්තමාන දායකත්වය නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 09)

14. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම දෙකක් (02) සඳහා සටහන් ලියන්න.

(i) ජෝන්ඩුවීගේ අධ්‍යාපන දර්ශනය
(ii) අධ්‍යාපන පරමාර්ථ හා අරමුණු ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාව
(iii) ශ්‍රී ලංකාවේ සමාජ පංති
(iv) සමාජ අවශ්‍යතා ඉටු කරලීම සඳහා අවිධිමත් අධ්‍යාපනයේ දායකත්වය

(ලකුණු 10 x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -